**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

# කුලියාපිටියෙහි ජාතික තාක්ෂණ අධ්‍යාපන විද්‍යාපීඨය ස්ථාපිත කිරීම

## ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනමින්)

මුදල් අමාත්‍යාංශය විසින් 2019.03.15 දිනැතිව නිකුත් කරන ලද අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් හා ක්‍රියාශීලී ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ප්‍රමාණ සමීක්ෂක තනතුර (PS4- වර්ගීකරණය A) තනතුර 01**

**සුදුසුකම් : ( පහත i හෝ ii හෝ iii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**හෝ**

ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ, අශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම

**සහ**

අවම වශයෙන්, අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ වසර 06ක පළපුරුද්ද

ii. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු විශේෂඥතා ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 11ක පළපුරුද්ද

iii. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම

**සහ**

ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද

**වැටුප :** PS 4 තලය : රුපියල් 100,000/- + රජයේ අනුමත දීමනා

**වයස :**

අදාළ අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනයට අවුරුදු 64 කට නොවැඩි විය යුතුය.

**ඉහත තනතුරු සඳහා අවශ්‍ය ප්‍රවීනතාවයන් :**

i. විශිෂ්ඨ අන්තර් පුද්ගලික සන්නිවේදන (කථන හා ලිඛිත) හැකියාවන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා ලිවීමේ කුසලතා

ii. Auto CAD හා MS Project හෝ සමාන කාර්ය පිළිබඳව ප්‍රවීනතාවය.

iii. පරිගණක සාක්ෂරතාවය සමඟ MS Office පැකේජ පිළිබඳ නිපුණතාව

iv. කාණ්ඩායමක් තුළ ස්වාධීනව කටයුතු කරමින් බහුවිධ රාජකාරී කළමනාකරණය

V. කොන්ත්‍රාත් ප්‍රතිපාදන සම්බන්ධව අර්ථ දැක්වීම සඳහා වන ප්‍රතිචාර හිමිකම් සමාලෝචන සම්බන්ධ ප්‍රවීනතාවය

විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත, ඉදිකිරීම් කොන්ත්‍රාත්වල පාලනය වන නියමයන් හා කොන්දේසි සහ නීතිරීති අර්ථ දැක්වීමේ නිපුනතාව හා ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා ලිවීමේ කුසලතා සතු අයහට ප්‍රමුඛතාව හිමිවේ.

**සේවයට බඳවා ගැනීමේ නියමයන්**

මූලිකව, බඳවා ගැනීම් වසර එකක කාලයක් සඳහා පූර්ණ කාලීන වශයෙන් කොන්ත්‍රාත් පදනමින් සිදුකරනු ලබන අතර, සතුටුදායක සේවා කාර්යසාධනය මත වාර්ෂිකව දීර්ඝ කිරීමේ අවකාශය ඇත. අදාළ රැකියා සේවා ස්ථානය කුලියාපිටිය නාරන්ගල්ල පිහිටි ව්‍යාපෘති වැඩ බිම වේ.

**අයදුම්පත් :**

තම සම්පූර්ණ ජීවදත්ත සමඟ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වල හා පළපුරුද්ද සම්බන්ධව සහතිකවල පිටපත් සමඟ ඇමතුම් අංක (ජංගම දුරකථන හා ඊමේල්) සහිතව ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර ඇතුළත්ව සකස්කළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, **2025 ජනවාරි 10** දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අදාළ සහතිවල පිටපත් අයදුම්පතට යාකොට තිබිය යුතුය.

රජයේ/ අර්ධරාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ** (KOICA)
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාතංශය,**
**6 වන මහල,**
**"ඉසුරුපාය", බත්තරමුල්ල.**